# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2341/05 – 2023 ජුලි මස 17 වැනි සඳුදා – 2023.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2019/76.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ආර්. එම්. නන්දන පුෂ්පකුමාර මයා, දියවැගිරෙන ඇල්ල, ස්ප්‍රිංවැලි.

2. කේ. එම්. කේ. සරත්චන්ද්‍ර මයා, අංක 120, වැලිකේමුල්ල, බදුල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, බදුල්ල ඩිපෝව, පස්සර පාර, හිඳගොඩ, බදුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාලඹේ, තලාහේන, මයුර මාවත, අංක 199/4, නීතිඥ එස්. ඒ. නිමල් සරණතිස්ස මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ජුලි මස 11 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2019/76.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ආර්. එම්. නන්දන පුෂ්පකුමාර මයා, දියවැගිරෙන ඇල්ල, ස්ප්‍රිංවැලි.
2. කේ. එම්. කේ. සරත්චන්ද්‍ර මයා, අංක 120, වැලිකේමුල්ල, බදුල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, බදුල්ල ඩිපෝව, පස්සර පාර, හිඳගොඩ, බදුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

''2008 අංක 02 දරන මුදල් කොට්ඨාස චක්‍රලේඛය අනුව වැටුප් සකස් කිරීමේ දී ix ශ්‍රේණියේ වැටුප් පියවරේ තබා ගෙවා ඇති වැටුප වැරදි යයි පවසා viii ශ්‍රේණියේ වැටුප් පියවරේ තැබීම හේතුවෙන් වැඩිපුර ගෙවන ලදැයි පවසන රු. 229,084.60/- ක මුදල රු. 5000/- වාරික වශයෙන් අඩු කර ගැනීම මගින් ආර්. එම්. නන්දන පුෂ්පකුමාර මහතාට හා කේ. එම්. කේ. සරත්චන්ද්‍ර මහතාට අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජුනි මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 – 0139

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.